# වර්ගවාදයේ පීතෘවරු



චම්පිකා රත්නායක

ධනපති සමාජය තමුන් ප්‍රජාතන්ත්‍රවාදී මානවවාදී පද්ධතියක් ලෙස ඉතිහාසයේ අවසානය කරා ලඟා වී ඇති බව පැවසුවත් වඩාත්ම ධනවාදය දියුණු රටවල වර්ගවාදී පීඩනය ඉතා තදින් බල පැවැත්වේ. මේ සඳහා ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින් ප්‍රජාවද, ඇමරිකාවේ අප්‍රිකානු සම්භවය ඇති ජනතාව ද සාක්ෂි දරනු ඇත.

"වර්ගවාදයට" අනුව සැලකෙනුයේ මිනිසුන් අතර ඉතා පැහැදිලි භෞතික ලක්ෂණ සහ සමාජ ලක්ෂණ සහිත විභේද ඇති බවයි. එහෙත් මෙහි ජීව විද්‍යාත්මක ව කිසිදු සත්‍යයක් නැත. මනුෂ්‍ය වර්ගයා තුළ ජානමය වෙනස් කම් සහිත උප කොටස් නොමැත. එවැනි "ජානමය වෙනස් කම් සහිත කාණ්ඩ" ඇත්නම් එම කාණ්ඩ අතර අන්තර් අභිජනනයෙන් සරු ජනිතයන් ඇති විය නොහැක. එහෙත් 'සුදු' සහ 'කලු' අය අතර ඇතිවන විවාහ වලින් වඩාත් උසස් ලක්ෂණ සහිත දරුවන් බිහිවන බව නිරීක්ෂණය කර තිබේ. 'වර්ග' අතර මෙන්ම 'ජාති' අතර සිදුවන විවාහ ද මෙවැනි ම වඩා බුද්ධිමත් දරුවන් බිහි කිරීමට හේතු වේ. ඒ ජාන මිශ්‍රවීම වැඩි නිසාය.

විවිධ ලක්ෂණ සහිත දරුවන් එකම පවුලක් තුළ හෝ නිවුන් දරුවන් අතර පවා දකිය හැක. මෙම විවිධත්වයට හේතු වන්නේ 'ජාන' වෙනස් වීම නොව ජාන වල ලක්ෂණ පෙන්නුම් කරන 'ඇලීල' වෙනස් වීම නිසා ය. මනුෂ්‍ය වර්ගයාට ම ඇත්තේ පොදු ජාන සමුච්චයකි. එබැවින් වර්ගවාදී බෙදීම පැහැදිලි ලෙස සමාජීය බෙදීමක් පමණි. මීට යොදාගෙන ඇත්තේ ද, ඓතිහාසික වශයෙන් හෝ සමාජීය වශයෙන් නිශ්චිත නොවන ජීව විද්‍යාත්මක වැදගත් කමකින් තොර වූ භෞතික ලක්ෂණ වේ. නමුත් මෙවැනි බෙදීම් වල දී වුව ද, එම කාණ්ඩ එකක් අනිකට වඩා උසස් ලෙස පෙන්විය නොහැක. නමුත් පුදුමයක් වන්නේ මෙවැනි බෙදීම් වල ප්‍රධාන අරමුණ ද එයම වීමය. මේ අනුව කිසිදු විද්‍යාත්මක පදනමක් රහිතව සුදු සම සහිත මිනිසුන් වඩා උසස් ලෙස පිළිගන්නා ලදී. එයින් 'සුදු' මිනිසුන්ට ඇති අයිතිවාසිකම් 'කලු' අයට අවශ්‍ය නැති බව සාධාරණීකරනය කෙරේ.

ජාති හිතෛශීභාවයට වර්ගවාදී පෙනුමක් දිය හැකිය. උදාහරණ ලෙස පලමුවන ලෝක යුද්ධයේදී බ්‍රිතාන්‍ය ප්‍රචාරක කටයුතු මගින් උත්සාහ කළේ ජර්මන් ජාතිය පහත් ලෙස සැලකූ ආසියානු වාර්ගික කණ්ඩායම් සමඟ සමාන කිරීමටය. ඒ සඳහා The Hun වැනි විශේෂණ පද යොදාගන්නා ලදී. දෙවන ලෝක යුද්ධයේ දී ඔස්ට්‍රේලියානු ප්‍රචාරක කටයුතු මගින් ආසියාවේ "Yellow hordes" සම්බන්ධයෙන් තිබෙන වර්ගවාදී බිය ගැන ප්‍රචාරය කෙරිණි.

**වර්ගවාදී පීඩනයේ ආරම්භය**

වර්ගවාදී පීඩනයේ ආරම්භය ධනවාදී සංවර්ධනයයි. විකිණීම සඳහා භාණ්ඩ නිපදවීම ධනවාදයේ ආවේනික ලක්ෂණයයි. මේ සඳහා ඉඩම් සහ ආම්පන්න වැනි නිෂ්පාදන උපකරණ එක සමාජ පන්තියක් සතු විය යුතු අතර අනිත් සමාජ පංති වලට මේවා අහිමි වීම නිසා ඔවුන්ට ධනපති පංතියට වැඩ කිරීමට බල කෙරේ. එම නිසා ධනවාදය පටන් ගැන්මේ සිටම පුද්ගලයන් ව ශ්‍රමය අනුව බෙදා වෙන් විය. තුන්වන ලෝකය දෙස බැලුවහොත් තාමත් මෙය එසේම යි.

මධ්‍යකාලීන යුරෝපයේ නව ධනපති පංතියට තම තහවුරු වීම පිණිස නිෂ්පාදන කාර්යය තම අතට ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය එකතු කිරීමට සිදු විය. මෙම කරුණේදී 1492, කොලම්බස් විසින් ඇමරිකානු ජනපද සොයා ගැනීම තීරණාත්මක විය. ස්පාඤ්ඤ හා පෘතුගීසි වැඩවසම් රදල පැලැන්තිය ඇමරිකානු ගෝත්‍රික ජනපදවාසීන් ගේ රන් හා රිදී කොල්ලකා ගෙන ඒවා පාවිච්චි කර එංගලන්තයේ, ප්‍රංශයේ, ඕලන්දයේ හා ජර්මනියේ මතු වී එන ධනේශ්වරය විසින් නිෂ්පාදනය කරන සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගත්හ.

රන් රිදී කොල්ලකා ගැනීමට සහ පසුව උක්, දුම්කොළ විවිධ ධාන්‍ය වර්ග ආදී යුරෝපයට යැවීමට වෙළෙඳ වගා සකස් කිරීම සඳහා මේ ගෝත්‍රිකයන්ගේ වගා බිම් අත්පත් කර ගැනීමට මෙම යුරෝපීය යටත් විජිතවාදී නායකයින් ක්‍රියා කළහ. මේ සඳහා මේ ගෝත්‍රික ජනතාව විශාල ගණන්වලින් විනාශ කර දමන ලදී. ඔවුන් "නව" ලෝකයට පැමිණ වසර 50 ක් තුළ දී මිලියන 15 ක් පමණ ගෝත්‍රික ජනකායක් විනාශ කර දමන ලදී. හයිටි, කියුබා, නිකරගුවා සහ වෙනිසියුලාවේ වෙරළ වැනි අධික ජනගහනයකින් සමන්විතව තිබූ ප්‍රදේශ මුලුමණින්ම ජන ශූන්‍ය කර දමන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස යුරෝපීය වතු හිමියන් බරපතල ශ්‍රම හිඟයකට මුහුණ පෑහ. මුල්කාලීනව මේ වැවිලිකරුවන් තමන්ගේ මව් රටවලින් ආනයනය කරන ලද ශ්‍රමයෙන් කටයුතු කෙරුව ද වතු වගා වඩ වඩාත් ව්‍යාප්ත වෙද්දී වඩාත් ලාභ හා පහසුවෙන් වෙන් කර හඳුනා ගැනීමට හැකි ශ්‍රම දාසයින්ගේ අවශ්‍යතාවය දැඩි විය. අප්‍රිකානු වහල් වෙළෙඳාම වතු වගාකරුවන්ගේ පිහිටට ආවේ මෙහිදී ය. "කලු වහලුන් ලාබෙට මිල දී ගත හැකි වූ අතර අප්‍රිකාවේ බටහිර ඉවුරෙන් අසීමිත සංඛ්‍යා වලින් ඔවුන් ගෙන ආ හැකි විය. සමේ කලු වර්ණය නිසා ඔවුන් හඳුනා ගැනීම පහසු වූ අතර පලායෑම හා අනිකුත් යටත් විජිතවාසීන් හා මුසු වීම ද වැලැක්විණි. සමේ වර්ණය වහල් බවේ සලකුණ විය. මෙය වර්ගවාදයේ ආරම්භය විය. සාමාන්‍ය පිළිගැනීමේ තිබෙන ආකාරයට වර්ගවාදය විසින් වහල්භාවය ඇති කලේ නැත. "සුදු සම", "කලු සම" ට වඩා උසස් යයි පිළිගන්නා වර්ගවාදය, නැගී එන ඇමරිකානු ධනවාදය විසින් වහල්භාවය සාධාරණීකරණය කිරීම සඳහා යොදා ගත්තේය.

වහලුන් නීත්‍යානුකූලව හිමිකර ගැනීම සහ වහල් වෙළෙඳාම යුරෝපීයයන් ඇමරිකාව අල්ලා ගැනීමට බොහෝ කලකට පෙර සිටම පැවැතුනේ ය. වැඩවසම් ස්පාඤ්ඤයේ සහ පෘතුගාලයේ එය හුරු පුරුදු සංස්ථාගත වූවක් විය. ස්පාඤ්ඤ නැව් බොහොමයක් වහල් වෙළෙඳාමේ නියුක්ත වූ අතර අප්‍රිකානු වහලුන් ඔවුන්ගේ නැව් වල රැගෙන ගියෝ ය. ඇත්ත වශයෙන්ම කොලම්බස් අත්ලාන්තික් සාගරය හරහා ගිය පළමු චාරිකාවේ දී පවා ඔහුගේ නැවියන් ලෙස අප්‍රිකානු වහලුන් රැගෙන ගියේය. කෙසේ නමුත් ස්පාඤ්ඤ සහ පෘතුගාල වැඩවසම් සමාජයේ නිෂ්පාදන පදනම වූයේ දාසයින් මිස නීත්‍යානුකූලව උරුම කරගත් වහලුන් නොවේ. වහල්භාවය වැඩවසම් ක්‍රමය තුළ පැවැතියේ අතරතුර ලෙස ය.

ස්පාඤ්ඤයන් හා පෘතුග්‍රීසීන් තමන් වහල්භාවයට ගත් "සුදු නොවන" මිනිසුන් ශුද්ධ වූ නීතිය මගින් තම ක්‍රිස්තියානි හාම්පුතුන්ට සේවය කරන මිත්‍යාදෘෂ්ටිකයන් ලෙස නම් කර ඇත. පෘතුගාලයේ වහල් වෙළෙඳාම මුලින්ම ආරම්භ වූ 15 වන ශත වර්ෂයේ මැද භාගය වන තුරුම අප්‍රිකානුවන් වහලුන් ලෙස ගැනීමේ දී මතවාදීමය සාධාරණීකරණය වූයේ සමේ කලු පැහැය නොව ඔවුන් ක්‍රිස්තු භක්තිකයන් නොවීම යි.

නමුත් ආගමික විශ්වාසය මත පදනම්ව මිනිසුන් වෙන් කිරීම ක්‍රම ක්‍රමයෙන් ගැටලු ඇති කළේය. එයට හේතුව "ක්‍රිස්තියානි" සහ මිත්‍යාදෘෂ්ඨිකයින් අතර වෙනස පරම්පරාවෙන් පරම්පරාවට උරුම නොවීම යි. නමුත් වහල්භාවයේ මිනුම්දණ්ඩ ලෙස සමේ වර්ණය ගත් කල කලු සම ඇති ජනයා වහල් සමාජ මට්ටමක සිටීම වඩා ස්වාභාවික ලෙස පෙනේ. වර්ගවාදීන්ගේ කරුණු දක්වීම අනුව ඊළඟ තර්කානුකූල පියවර වන්නේ කෙසේ හෝ 'කලු' අය ස්වාභාවයෙන් ම 'සුදු' අයට වඩා පහත් ලෙස උපකල්පනය කිරීම යි.

**ජාතිය හා වර්ගය**

එක්සත් ජනපදයේ දකුණු ප්‍රාන්තවල ධනපති වතු හිමියන් විසින් වහල් ශ්‍රමය පාවිච්චි කිරීම සාධාරණීකරණය කරනු සඳහා එවැනි මතවාදයක් වැදගත් විය. ඇමරිකා එක්සත් ජනපදයේ නිදහස ප්‍රකාශ කිරීමේ දී පෙන් වූ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී මතවාදයට අනුව සුදු වහලුන් සිටීම පැහැදිලිව ම පරස්පර විරෝධී ය. නමුත් "කලු" වහල්භාවය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය සමග සමබර කළ හැක. ඒ ".....අප්‍රිකානු සම්භවය සහිත මිනිසුන්, මිනිසුන් නොවන අතර ඔවුන් 'ළමුන්ට සමාන' උප මිනිසුන් වන බැවින් ඔවුන්ට සමාන අයිතිවාසිකම් දිය යුතු නොවේ....." යන වර්ගවාදී අදහස ප්‍රචාරය කිරීමෙනි. කාන්තාවන්ට හා පිරිමින්ට සම අයිතිවාසිකම් අහිමි කිරීමේ දී ද මීට සමාන තර්කයන් යොදාගනු ලැබේ. 19 වන ශත වර්ෂයේ අගභාගයේ දී වහලුන් නීත්‍යානුකූලව හිමිකර තබා ගැනීම අහෝසි කිරීම නිසා වර්ගවාදී අදහස් ප්‍රචාරය කිරීම වඩාත් ප්‍රචලිත විය.

1890 එක්සත් ජනපදයේ apartheid-like වර්ග ලෙස බෙදීමේ ක්‍රමය හඳුන්වා දීම කාර්මීකරණය වූ ධනේශ්වර ජාතීන් විසින් අප්‍රිකාව හා ආසියාව යටත් විජිතකරණය කිරීමට සමානුපාත වේ. එනිසා වර්ගවාදය අධිරාජ්‍යවාදයේ ව්‍යාප්ත වීමට මතවාදී සාධාරණත්වයක් ලබා දුනි. The Nation නමින් 1898 දී මුද්‍රණය වූ ලිබරල්වාදී එක්සත් ජනපද සඟරාවක දකුණු ප්‍රාන්ත වල අප්‍රිකානු ඇමරිකානුවන්ට ඡන්ද අයිතිය ප්‍රතික්ෂේප කිරීම අනුමත කළ සුප්‍රීම් උසාවි තීරණය ගැන කරුණු පැහැදිලි කරමින් ලියා තිබූ ලිපියක මෙසේ සඳහන් විය. ".....ඡන්ද අයිතිය ලබා දිය නොහැකි විවිධාකාර වූ පහත් වාර්ගික කොටස් ලෝකයේ විවිධ පළාත් වලින් ගැනීම ගැන සලකා බලමින් සිටි අවදියක මෙම වැදගත් තීරණය ලබා දීම ආශ්වාද ජනක වන්නේ ය....."

19 වන ශතවර්ෂයේ දී වර්ගවාදී අදහස් වල වැඩිවීමට තවත් හේතු සාධක දෙකක් දකිය හැකිය. එනම් ආසියාවේ සහ අප්‍රිකාවේ විශාල යටත්විජිත රාජ්‍ය අත් කර ගැනීම දක්වා යුරෝපීය ධනවාදයේ පැතිරීම සහ මානව පරිණාමය ගැන ඇති වූ මුල් මතවාද වේ. දෙවන කරුණ දල වශයෙන් හදාරා බැලීමෙන් මුල් තත්ත්වය සමඟ නව ගෝලීය මර්දනකාරී සම්බන්ධයක් ඇති වීම සාධාරණීකරණය කිරීමට ආධාර විය. ධනේශ්වර මතවාදීන්ට සුදු අය කලු අයට වඩා උසස් වීම විද්‍යාත්මකව ඔප්පු කිරීමට එදා හැකි විය.

ජාතියක් වර්ගයකට වඩා වෙනස් වේ. එය පොදු ධනවාදී ආර්ථික ක්‍රමයත්, පොදු භූමියත්, භාෂාවක් සහ සමාජ මානසිකත්වයක්, පොදු සංස්කෘතියක් තුළ ක්‍රියාත්මක වන ස්ථාවර මිනිස් ගහනයකි. නමුත් ඒ සමඟම ධනේශ්වර චින්තනය "ජාතිය" වර්ගවාදය ට ද ලක් කර ඇත. ජාතික අංග වර්ගවාදී ලක්ෂණ වලට ආරෝපනය කර ඇත. එබැවින් 19 වෙනි හා 20 වන ශතවර්ෂයේ මුලු කාලයේ දී නියම ඔස්ට්‍රේලියානුවන් නම් බ්‍රිතාන්‍ය ජාතික වාර්ගික කාණ්ඩයෙන් පැවත එන්නන් ලෙස සලකන ලදී.

ජාති හිතෛශීභාවයට වර්ගවාදී පෙනුමක් දිය හැකිය. උදාහරණ ලෙස පලමුවන ලෝක යුද්ධයේදී බ්‍රිතාන්‍ය ප්‍රචාරක කටයුතු මගින් උත්සාහ කළේ ජර්මන් ජාතිය පහත් ලෙස සැලකූ ආසියානු වාර්ගික කණ්ඩායම් සමඟ සමාන කිරීමටය. ඒ සඳහා The Hun වැනි විශේෂණ පද යොදාගන්නා ලදී. දෙවන ලෝක යුද්ධයේ දී ඔස්ට්‍රේලියානු ප්‍රචාරක කටයුතු මගින් ආසියාවේ "Yellow hordes" සම්බන්ධයෙන් තිබෙන වර්ගවාදී බිය ගැන ප්‍රචාරය කෙරිණි.

වර්ගවාදය විසින් 'සුදු නොවන' වාර්ගික ජන කොටස් 'අර්ධ මනුෂ්‍යයින්' ලෙස හඳුන්වයි. ඒ නිසා ප්‍රතිගාමීන් විසින් කාණ්ඩ බොහොමයකට වර්ගවාදය යොදා ඇත්තේ තමන් විසින් සිදු කරන හිංසන සාධාරණීකරනය කිරීමට යි. උදාහරණ ලෙස යුරෝපයේ යුදෙව් ජාතිකයින්ට හිංසා කිරීම වර්ගවාදීන් කර ඇත්තේ සාවද්‍ය ලෙස යුරෝපීය යුදෙව්වන් සැමිටික් වාර්ගික කාණ්ඩයේ සාමාජිකයන් යයි හඳුන්වමිනි. රුසියානු සිවිල් යුද්ධයේ සුදු හමුදා වල ප්‍රචාර මගින් විරුද්ධවාදි කොමියුනිස්ට් වරුන් වර්ගවාදී ලෙස හඳුන්වා දීමට උත්සාහ කර ඇත්තේ බොල්ෂෙවික් වරුන් යුදෙව්-සැමිටික් වාර්ගික සාමාජිකයන් ලෙස පෙන්වා දෙමිනි.

19 වන ශත වර්ෂයේ බටහිර යටත් විජිතවාදයේ නැගීමේ පටන් සියලු අධිරාජ්‍යවාදී රටවල ජාතිකත්වය ක්‍රමානුකූලව වර්ගවාදීකරණයට ලක් කර ඇත. යුරෝපීයයන්, උතුරු ඇමරිකානුවන්, බ්‍රිතාන්‍ය පරම්පරාවේ ඕස්ට්‍රේලියානුවන් දක්වා ඇත්තේ අප්‍රිකානුවන්, අරාබිවරුන් හා ආසියානුවන්ට වඩා උසස් ලෙසය. ඒ මෙය යටත්විජිත පාලනය සහ අධිරාජ්‍යවාදී සූරාකෑම සාධාරණීකරණය කළ නිසයි. වර්ගවාදය බහුලව පාවිච්චි කළේ යටත්විජිත යුද්ධ සාධාරණය කිරීමට යි. නමුත් දෙවන ලෝක යුද්ධයෙන් පසුව ආසියානු, අප්‍රිකානු සහ මැද පෙරදිග රට වලට නිල වශයෙන් නිදහස දීමෙන් පසුවත් මෙය අවසන් වූයේ නැත. උදාහරණ වශයෙන් වියට්නාම් යුද්ධ කාලයේ "Gooks" සහ "Slopen" වශයෙන් නම් කෙරුණ වියට්නාම්වරුන් සමඟ සටන් කිරීමට ඇමරිකානු සහ ඔස්ට්‍රේලියානු සොල්දාදුවන් උනන්දු කරන ලදී.